**ගොවීන්ගේ භාරකාර අරමුදල - 2018**

---------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ගොවීන්ගේ භාරකාර අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 වර්ෂයේදී ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොළිය රු.4,859,898 ක ආදායම් ලෙස ගිණුම්ගත වී තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී ආදායමට උපලබ්ධි වීමේදී නැවත වරක් ආදායම ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් අතිරික්තය හා ලැබිය යුතු පොළී ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | එය ගිණුම් සටහන් කිරීමේදී සිදු වී ඇති දෝෂයකි. එය 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | පසුගිය වර්ෂයට අදාල ආදායම ලැබීමේදී අදාල ගිණුම් වලට නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) ප්‍රාදේශීය සංවර්ධන බැංකු හරහා ලබා දී තිබුණු ණය වෙනුවෙන් බැංකුව වෙත ලැබී තිබූ රු.5,094,919 ක ණය වාරික හා පොළී මුදල මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොතිබුණි. | එම මුදල 2019 වර්ෂයේදී අරමුදලේ අවසන් ගිණුම් වාර්තාවලට ඇතුළත් කර ගිණුම් වාර්තාව සංශෝධනය කිරීමට කටයුතු කරමි. | බැංකුවට ලද සෘජු ලැබීම් හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කල යුතුය. |

### 1.5.2 පැහැදිලි නොකළ වෙනස්කම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට අදාලව භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ගොවිසෙත ලොතරැයි ආදායම රු.3,542,059,053 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මගින් දක්වා තිබුණද, භාණ්ඩාගාර පොත් අනුව එය රු.3,406,797,355 ක් වූයෙන් රු.135,261,698 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2019 වර්ෂයේ සිට භාණ්ඩාගාරය සහ ගොවිභාරකාර අරමුදලට දන්වා එවන ලද ගොවිසෙත ආදායම් ශේෂ තහවුරු කර ගැනිමට කටයුතු කරමි. | මහාභාණ්ඩාගාරයෙන් විමසීම් සිදු කොට නිවැරදි කර ගැනීමට කටයුතු කල යුතුය. |

### 1.5.3 අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සංශෝධිත වැය ඇස්තමේන්තුව මගින් ව්‍යාපෘති 59 ක් වෙනුවෙන් රු.666,458,848 ක් වූ මුදලක් ඇස්තමේන්තු කර තිබුණද, පිරිවැය රු.379,261,180 ක් වූ ව්‍යාපෘති 35 ක් පමණක් ආරම්භ කර තිබුණි. | ආයතන විශාල සංඛ්‍යාවක් සමග සියළු දිස්ත්‍රික් ආවරණය වන පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ප්‍රායෝගික ගැටළු නිසා සමහර ව්‍යාපෘති ආරම්භ කිරීමට නොහැකි වන අතර සමහර ව්‍යාපෘති වලට අදාළව මූලික කටයුතු සිදු කලත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | ක්‍රියාත්මක කලහැකි ව්‍යාපෘති තෝරා ඇස්තමේන්තු ගත කිරීමට කටයුතු කල යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- |
| (අ) | ණයගැතියෝ | 9,603,076 | ශේෂ සනාථ කිරීමේ ලිපි හා ණයගැති කාල විශ්ලේෂණය | •1999දී රු.1,679,900ක් නියෝජ්‍ය ගොවිජන සේවා කොමසාරිස් (ඌව) - රතුඇණු බීජ ගොවීන් වෙත ණය පදනම මත ලබා දීම සඳහා තෙළුල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ලබා දී ඇති ණය මුදලකි. මෙම ශේෂය තහවුරු කර එවීමට අදාළ ආයතන සතුවද තොරතුරු නොමැති බැවින් ශේෂ සනාථන ලිපි එවා නොමැත. | අදාල පාර්ශව වෙත ලිපි යවා ශේෂ සනාථ කිරීම් ලබා ගැනීමට වගකිව යුතු නිලධාරියකු පත්කිරීමට කටයුතු කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | •1991 දී රු. 7,923,174.95 ක් කෘෂිකාර්මික භාරකාර අරමුදල මගින් ගොවිභාරකාර අරමුදල වෙත පවරන ලද ශේෂයකි. 2002.12.31 දිනට මෙම ශේෂය සැකසී ඇති දිස්ත්‍රික්ක වල නාමලේඛනයක් පමණක් ඇත. නමුත් එම දිස්ත්‍රික්ක සතුව මෙම ශේෂය පිලිබඳ තොරතුරු නොමැති බව දන්වා ඇති බැවින් ශේෂ සනාථන ලිපි යවා නොමැත. | |
| (ආ) | ගොවීන්ගේ තැන්පතු | 697,644 | විස්තරාත්මක තැන්පතු ලේඛනය | මෙම ශේෂය ගොවිභාරකාර අරමුදල වෙත පවරා ඇති ශේෂයක් පමණි. තැන්පතු ලේඛනයක් නොමැත. මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට විශේෂ සාකච්ඡාවක් කැඳවීමට නියමිතය. | තැන්පතු ලේඛනයක් සකස් කර පවත්වා ගැනීමට කටයුතු කලයුතුය. |
| (ඇ) | කොටස් ගිණුම | 591,965 | කොටස්කරුවන් ගේ නාම ලේඛනය | මෙම ශේෂය ගොවිභාරකාර අරමුදල වෙත පවරා ඇති ශේෂයක් පමණි. කොටස් හිමි නාම ලේඛනයක් නොමැත. මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට විශේෂ සාකච්ඡාවක් කැඳවීමට නියමිතය. | කොටස්හිමි නාම ලේඛනයක් සකස් කර පවත්වා ගැනීමට කටයුතු කලයුතුය. |
| (ඈ) | අත්තිකාරම් | 28,539,239 | කාල විශ්ලේෂණය | එම ශේෂයන්ට අදාළ කාල විශ්ලේෂණයන් කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | අවසන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අවස්ථාවේදීම කාල විශ්ලේෂණයත් සකස් කර විගණනයට ලබාදීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | කෙටිකාලීන ණය | 141,924,200 | කාල විශ්ලේෂණය | එම ශේෂයන්ට අදාළ කාල විශ්ලේෂණයන් කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | - එම - |
| (ඊ) | දිගුකාලීන ණය | 190,977,723 | කාල විශ්ලේෂණය | එම ශේෂයන්ට අදාළ කාල විශ්ලේෂණයන් කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | ගොවිසෙත අරමුදල් ශේෂය | 159,399,408 | ශේෂය සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි | ගොවීන්ගේ භාරකාර අරමුදලේ වසර ගණනාවක සිට දිගින් දිගටම පවතින රු. 159,399,408 ක මෙම ගොවිසෙත අරමුදල් ශේෂය 2002 වර්ෂයේ සිට පැවත එන්නකි. මේ පිළිබඳ තොරතුරු පැරණි ලිපි ගොනු පරීක්ෂා කර සොයා ගැනීමට කටයුතු කරමින් පවතින අතර ඒ පිළිබඳ කඩිනමින් ඔබ වෙත කරුණු දක්වනු ලැබේ. | ශේෂය සනාථ කිරීමට කටයුතු කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.19,792,044 ක්වූ ණයගැති ශේෂ අයකර ගැනීමකින් තොරව වර්ෂ 03 සිට වර්ෂ 17 දක්වා වූ කාලයක් මුල්‍යා ප්‍රකාශනවල පෙන්වා තිබුණි. | මෙම ශේෂයන් අයකර ගත නොහැකි මට්ටමක පවතින අතර අඩමාණ ණය වෙන් කොට නොමැති බැවින් ගිණුම්වලින් නිරවුල් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | අදාල අනුමැතියන් ලබාගෙන නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) අරමුදල විසින් පත්කරන ලද සමීක්ෂණ මණ්ඩලය මගින් ඉදිරිපත් කරන ලද සමීක්ෂණ වාර්තාව අනුව රු.7,241,656 ක් වූ ඉතිරිකිරීමේ ගිණුමේ ශේෂය අයවිය යුතු ණය ශේෂයක් ලෙස වෙනස්විය යුතු බව පෙන්වා තිබුණි. | මේ සම්බන්ධයෙන් තවදුරටත් කරුණු පැහැදිලි කර සනාථ කරගැනීමෙන් අනතුරුව තීරණයකට එළඹීමට බලාපොරොත්තු වේ. | මෙම ශේෂය පිළිබඳව කරුණු සනාථ කර ගැනීමෙන් අනතුරුව නිසි පරිදි ගිණුම් තැබීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

## 1.7 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 අංක 10 දරණ දේශීය ආදායම් බදු පනතට අනුව බදු ගෙවිය යුතු ආයතනයක් වුවද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ගෙවිය යුතු ආදායම් බදු ලෙස රු.30,724,871 ක් වෙන්කර තිබුණද මේ දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේදී ආදායම් බදු ගෙවීමට ගොවීන්ගේ භාරකාර අරමුදල ලියාපදිංචි වී ඇති අතර මෙම වසරේ සිට බදු ගෙවීමට කටයුතු කරනු ඇත. | දේශීය ආදායම් බදු පනතට අනුකූලව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 82,914,878 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.47,097,871 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 35,817,007 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සංවර්ධන වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේ භාරකාර ඔප්පුවේ සඳහන් අරමුණු ඉටු කිරීම සහ සුළු ගොවීන්ගේ කෘෂිකාර්මික සංවර්ධනය හා සුභසාධනය සඳහා අරමුදල ආරම්භ වුවද එම අරමුණු සඳහා ප්‍රමාණවත් ලෙස යොදා නොගෙන රු.835,001,919 ක් ස්ථාවර තැන්පතුවල ද රු.93,042,910 ක් භාණ්ඩාගාර බිල්පත්වලද ආයෝජනය කර තිබුණි. | ඉදිරියේ දී සංවර්ධන ව්‍යාපෘති සඳහා වැඩි මුදකල් වෙන් කිරීමේ අරමුණු ඇතුව ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්හට ව්‍යාපෘති සකස් කිරීම හා පසු විපරම සම්බන්ධයෙන් පුහුණුවක් ලබා දී ප්‍රාදේශිය මට්ටමේ සංවර්ධන යෝජනා ලබා ගෙන කටයුතු කිරීමට සැළසුම් කර ඇත. | සුළු ගොවීන්ගේ කෘෂිකාර්මික සංවර්ධනය හා සුභසාධනය උදෙසා ප්‍රමාණවත් ලෙස අරමුදල් යෙදවිය යුතුය. |
| (ආ) | ගොවිසෙත ලොතරැයි ආදායමින් සමාලෝචිත වර්ෂය අවසානයට ගොවි භාරකාර අරමුදල වෙත භාණ්ඩාගාරයෙන් ලැබිය යුතුව තිබූ රු.3,542,059,053 ක මුදල ගොවීන්ට සෙත සැළසීමේ වැඩසටහන් සඳහා යෙදවීමට අවශ්‍ය සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට අරමුදලේ අවධානය යොමුකර නොතිබුණි. | ගොවිසෙත ලොතරැයි ආදායම් ශේෂය පිළිබඳ පෙන්වා දී ඇති වෙනස සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයෙන් හා ජාතික ලොතරැයි මණ්ඩලයෙන් විමසීම් සිදු කොට නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. එමෙන්ම 2019 වර්ෂයේ සිට භාණ්ඩාගාරය සහ ගොවිභාරකාර අරමුදලට දන්වා එවන ලද ගොවිසෙත ආදායම් ශේෂ තහවුරු කර ගැනීමට කටයුතු කරමි. | ගොවිසෙත ලොතරැයි ආදායම ගොවීන්ට සෙත සැළසීමේ වැඩසටහන් සඳහා යෙදවීමට අවධානය යොමුකල යුතුය. |

| | | |
|---|---|---|
| ඇ) කාබනික රෙඩ්ලේඩි පැපොල් වගාව සඳහා මොරගොල්ලාගම ගොවි මහතෙකු වෙත රු.600,000 ක මුදලක් ඇප සුරැකුම් ලබා ගැනීමකින් තොරව 2015 නොවැම්බර් 16 දින නිදහස් කර තිබූ අතර ක්ෂේත්‍ර චාරිකා වාර්තාවල ප්‍රගතියක් නොමැති බව වාර්තා කර තිබියදීත් ඒ පිළිබඳ නොසලකා රු.400,000 ක්වූ දෙවන ණය වාරිකය 2016 මාර්තු 04 දින නිදහස් කර තිබුණි. 2019 අප්‍රේල් මස වන විටත් ණය වාරික අය කර ගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණි. | මෙම ණය මුදල 2018 වර්ෂයේ නොවැම්බර් මස ගෙවා අවසන් කල යුතුව තිබිණි. එහෙත් මේ දක්වා කිසිදු වාරික මුදලක් ගෙවා නොමැත.<br>මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා වන මූලික කටයුතු අවසන් කර කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ගොවිජන විනිශ්චය සභාව වෙත යොමු කර ඇත. | ණය වාරික අය කර ගැනීමට හෝ නීතිමය පියවර ගැනීමට කටයුතු කලයුතුය. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථිර කාර්ය මණ්ඩලයක් නොමැතිවීම හේතුවෙන් ණය අයකර ගැනීමේ ප්‍රගතිය පහළ මට්ටමක වීම, නොපියවූ අත්තිකාරම් පැවතියදී නැවත නැවතත් අත්තිකාරම් ලබා දීම, ණය අයකර ගැනීමේ කාල ප්‍රමාදය, අය නොවන ණය කපා හැරීමට ලක් කිරීම ආදිය සිදුවීමෙන් අරමුදලේ මූල්‍ය කළමනාකරණය සතුටුදායක මට්ටමක නොපවතින බව නිරීක්ෂණය විය. මෙම කටයුතු සාර්ථක කරගැනීම සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් පත්කර ගැනීමට බඳවා ගැනීමේ කාර්යපටිපාටියක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට ආයතනය මෙතෙක් කටයුතු කර නොතිබුණි. | මෙම තත්ත්වය පිළිගනිමි. වරින් වර අමාත්‍ය මණ්ඩල මාරුවීම මත පනතේ කටයුතු මේ වන විටත් අවසන් කර ගැනීමට නොහැකි වී ඇත. පනත සම්මත වූ පසුව ස්ථිර කාර්ය මණ්ඩලයක් පත් කර විධිමත් බඳවා ගැනීමේ පරිපාටි සකස් කර ඉදිරි කටයුතු කිරීමට සැලසුම් සකස් කර ඇත. | බඳවා ගැනීමේ කාර්යපටිපාටියක් සකස් කර ස්ථිර කාර්ය මණ්ඩලයක් පත්කර ගැනීමට කටයුතු කලයුතුය. |

### 3.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 (ආ) ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ව්‍යාපෘති යෝජනා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබන නිසා වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මක් සකස් කරනු නොලැබිය. එහෙත් 2019 වර්ෂයේ සිට නියමිත පරිදි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. | චක්‍රලේඛය පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කලයුතුය. |